# 2. ජාතික ආදායම හා වියදම

## 2.1 සමස්ත උපනතීන්

පසුගිය වර්ෂ කිහිපය තුළ, නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ඔස්සේ ලබාගත්, ඉහළ වර්ධන වේගය අඛණ්ඩව පවත්වාගැනීමට 1995 වර්ෂයේදීද ශ්‍රී ලංකාව සමත් විය. දළ දේශීය නිෂ්පාදිතයය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 5.5 කින් වර්ධනය වූ අතර, එය පසුගිය වර්ෂ පහ තුළ වාර්තා වූ වාර්ෂික වර්ධන අනුපාතයෙහි සාමාන්‍යයට සමාන විය. මේ අතර, ආයෝජන ආදායම පිටතට ගලා යාමෙහි තියුණු අඩුවීමක් පෙන්නුම් කරමින් දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) (දළ දේශීය නිෂ්පාදිතයට විදේශීය ශුද්ධ සාධක ආදායම එකතු කිරීමෙන් ගණනය කෙරේ) සියයට 5.9 කින් වර්ධනය විය.

පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය 1995 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 661,902 ක් වශයෙන් ඇස්තමේන්තු කොට ඇත. මැදි වසර ජනගහනය දශ ලක්ෂ 18.1 වශයෙන් ඇස්තමේන්තු කොට ඇති අතර, ඒ අනුව 1995 වර්ෂයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය රුපියල් 36,545 හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 713 ක් වෙයි. මෙය දකුණු ආසියාතික රටක වාර්තාගත වැඩිම ඒක පුද්ගල ආදායම වුවත්, (ඉන්දියාව ඇ.එ.ජ. ඩොලර් 286, පකිස්ථානය ඇ.එ.ජ. ඩොලර් 404, බංගලාදේශය ඇ.එ.ජ. ඩොලර් 208, මාලදිවයින ඇ.එ.ජ. ඩොලර් 623, නේපාලය ඇ.එ.ජ. ඩොලර් 169) එය කාර්මික රටවල් සමග (ඇමෙරිකා එක්සත් ජනපදය ඩොලර් 25,852, ජපානය ඇ.එ.ජ. ඩොලර් 36,739, ජර්මනිය ඇ.එ.ජ. ඩොලර් 22,539) හෝ ආසියාතික නගර රාජ්‍යයන් (සිංගප්පූරුව ඇ.එ.ජ. ඩොලර් 23,532, හොංකොං ඇ.එ.ජ. ඩොලර් 18,895) සහ වෙනත් නැගී එන ආසියානු ආර්ථිකයන් සමග සසඳන කල (දකුණු කොරියාව ඇ.එ.ජ. ඩොලර් 8,540, තායිවානය ඇ.එ.ජ. ඩොලර් 12,187, මලයාසියාව ඇ.එ.ජ. ඩොලර් 3,558, තායිලන්තය ඇ.එ.ජ. ඩොලර් 2,411) ඉතා අඩු මට්ටමක පවතින අතර, ඉන්දුනීසියාවට (ඇ.එ.ජ. ඩොලර් 909) තරමක් දුරට ආසන්න වෙයි.[1]

කෙසේවුවද, දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා අනුව විවිධ ආර්ථිකයන් සැසඳීමත්, ඒ අනුව එම රටවල ජීවන මට්ටම්හි සාපේක්ෂ වෙනස්කම් දැක්වීමත් ඉතා ප්‍රවේශමෙන් කළ යුතු කාර්යයක් වෙයි. මෑතකදී ඇමෙරිකානු ඩොලරය පදනම් කරගත් ක්‍රය ශක්තිය අනුව දළ දේශීය නිෂ්පාදිතය ගණන් බැලීමට උත්සාහ ගෙන ඇත. (1 විශේෂ සටහන බලන්න.) මෙ මගින් වුවත් නියෝජනය වනුයේ යථාර්ථයට සමීප තත්ත්වයක් පමණි. කෙසේවුවත් නැගී එන ආසියාතික ආර්ථිකයන්ගේ තත්වයට ලඟාවීමට පවා ශ්‍රී ලංකාවට බොහෝ දුරක් යාමට තිබෙන බව නිශ්චිත කරුණකි.

කෙසේවුවද, වසර 17 කට පසු පාලනය වෙනස්වූවාට පසු වර්ෂයක ආර්ථිකය නොකඩවා ඉදිරියට යාම අනාගතය පිළිබඳ ශුභ ලකුණු පෙන්වන්නකි. නව පරිපාලනය, දේශපාලන වෙනස්කම් නොසලකා විවෘත හා වෙළඳපොළ මිත්‍රශීලි ප්‍රතිපත්ති කෙරෙහි දක්වන දැඩි කැපවීම ආයෝජකයන්ගේ බලවත් සතුටට හේතුවී ඇත. එසේම, උතුරු- නැගෙනහිර ප්‍රදේශයන්හි දිගුකාලයක සිට පවතින අර්බුදකාරී තත්ත්වය සාකච්ඡා මගින් විසඳන්නට දැරූ දැඩි කැපවීම ද බලවත් ප්‍රසාදයට පත්වී ඇත. එහෙත් අවාසනාවන්ත ලෙස 1995 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට සාකච්ඡා බිඳවැටී, නැවතත් එදිරිවාදිකම් ආරම්භ වීම, ආර්ථිකයෙහි නිෂ්පාදනය සහ ආයෝජනය වැනි ක්‍රියාවලියන්ට බාධාවක් වෙමින් පවතී. 1994 වර්ෂයේ අග භාගයේදී මැක්සිකානු ආර්ථික අර්බුදය නිසා ඇති වූ අවිනිශ්චිත භාවය හේතුකොටගෙන ආසියාවෙහි නැගී එන ආර්ථිකයන්හි විදේශ ආයෝජනයන් අඩුවීම මෙම තත්ත්වය තවදුරටත් උග්‍රවීමට හේතු විය.

කෘෂි අංශය සම්බන්ධයෙන් බලපෑ යහපත් කාලගුණික තත්ත්වය සහ ප්‍රාථමික භාණ්ඩ මිල ඉහළ යාමද, 1995 වර්ෂයේ ආර්ථිකයෙහි වූ සතුටුදායක ක්‍රියාකාරිත්වයට ආධාර විය. පාන් පිටි සහනාධාර මිලකට ලබාදීම හේතුවෙන් සහල් මිල පහත වැටීමේ අවාසිදායක තත්ත්වය තිබියදීත්, 1995 වර්ෂයේදී වාර්තාගත වී නිෂ්පාදිතයක් ලබාගැනීම සුවිශේෂ කරුණක් විය. ඒ හේතුවෙන්, එම වර්ෂයේ සහල් ආනයනය ඉතා අඩු මට්ටමකට පත් විය. රබර් හා තේ මිල ගණන් වාර්තාගත තත්ත්වයකට පත් වූ නමුත්, එම වගාවන්හි පවතින ව්‍යුහාත්මක ප්‍රශ්න හේතුකොට ගෙන නිෂ්පාදනය වැඩි කර ගැනීමට නොහැකි වූ නිසා, එම මිල ඉහළ යාමෙහි සම්පූර්ණ ප්‍රතිලාභය ලබාගත නොහැකි විය. ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයට අයත් වතු වැවිලි අංශය තවදුරටත් අඩු ඵලදායිතාවය, ඉහළ පිරිවැය සහ මූල්‍ය සීමාකම් වලින් පීඩා විඳින ලදි. වන, දැව හා ධීවර යන අංශ ද ඇතුළත් සමස්ත කෘෂි අංශය, 1995 වර්ෂයේදී සියයට 3.3 කින් වර්ධනය වූ අතර, එය පසුගිය වර්ෂයේ එම අංශය වාර්තා කළ වර්ධන වේගයටම සමාන විය. කෙසේවුවද, 1994 වර්ෂයේදී සියයට 21 ක්ව පැවති එම අංශය දළ ජාතික නිෂ්පාදිතයට වූ දායකත්වය, 1995 වර්ෂයේ සියයට 20 දක්වා අඩුවිය. 1994 වර්ෂයේ ආර්ථික වර්ධනයට කෘෂි අංශය දැක්වූ සියයට 13 ක් වූ දායකත්වය, 1995 වර්ෂයේදී සියයට 12 දක්වා අඩුවූ අතර, එම දායකත්වය මූලික වශයෙන් ලැබුනේ වී සහ වතු නොවන වැවිලි අංශයෙහි මිරිස්, අර්තාපල්, එළුණු, එළවළු ඇතුළු අනෙකුත් දේශීය පරිභෝජනයට යොදා ගැනෙන බෝග වගාවන්ගෙනි. මේ අතර ධීවර අංශය සියයට 5 ක සැළකිය යුතු වර්ධන වේගයක් වාර්තා කළේය.

කෘෂි අංශයෙහි අඩුවෙමින් පවතින කාර්ය භාරය සැළකිල්ලට භාජනය විය යුතු කරුණකි. ඊට හේතු වන්නේ එම අංශය, ශ්‍රම බලකායෙන් සියයට 37 කට රැකියා සැපයීමත්, රටෙහි ආහාර අවශ්‍යතාවයෙන් ඉතා විශාල ප්‍රමාණයක් සපුරාලීමත්, උපනයන ආදායමෙන් සියයට 22 කට දායක වීමත්, කෘෂි කර්මාන්තය පදනම් වූ කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීමේ හැකියාවක් එම අංශයට ඇති නිසාත්ය. රජයට අයත් වතු වැවිලි අංශය ආශ්‍රිත ප්‍රශ්න, ඒවායෙහි කළමනාකරණය දිගුකාලීන බදු පදනම මත පෞද්ගලික අංශයට පැවරෙන, වර්තමාන පෞද්ගලිකරණ ප්‍රතිපත්ති මගින් විසඳ ගැනීමට අපේක්ෂිත අතර, එමගින් එම අංශයෙහි ඵලදායිතාවය ඉහළ නැංවීමට නව කළමනාකරුවන්ට දිරි දීමක් වනු ඇත. වැවිලි නොවන කෘෂි අංශය සම්බන්ධයෙන් සලකන කල, ඉඩම් පවරා ගැනීම, ආනයන තීති, ණය හා යෙදවුම් යොමු කිරීම, අධි ආරක්ෂණය වැනි විෂයයන් කෙරෙහි රජය ඇතිකරන දැඩි බලපෑම ලිහිල් කිරීමට උත්සාහ ගනු ලැබේ.

නිමැවුම් කර්මාන්ත අංශයෙහි තියුණු වර්ධනය, ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මෑතකාලීන ලක්ෂණයක් වන අතර, එය නිදහස් ආර්ථිකයෙහි සෘජු ප්‍රතිඵලයක් වේ. මෙම අංශය, 1995 වර්ෂයේදී

[1] තායිවානය (1995) බංග්ලාදේශය, ඉන්දියාව හා හොංකොං (1993), හැර අනිකුත් රටවල් සඳහා 1994 වර්ෂය සඳහා වූ දත්ත සඳහන් වේ. ශ්‍රී ලංකාව සඳහා 1993 හා 1994 සඳහා ඒක පුද්ගල ද.දේ.නි අගයන් පිළිවෙලින් ඇ.එ.ජ. ඩොලර් 587 හා 656 වේ. (මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය සංඛ්‍යාන (IFS) - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මාර්තු 1996 සහ ලෝක බැංකු සංඛ්‍යා සටහන් - 1995, World Tables)

සංඛ්‍යා සටහන 2.1

## ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1994 - 1995

| අංශ | වැඩිවීමේ අනුපාතය (%) | | ද.ජා.නි. හි වැඩිවීමෙහි ප්‍රතිශතක දායකත්වය | | ද.ජා.නි. හි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | 1994* | 1995* | 1994* | 1995* | 1994* | 1995* |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 3.3 | 3.3 | 13.3 | 11.5 | 20.8 | 20.3 |
| කෘෂිකර්මය | 3.8 | 3.3 | 12.8 | 9.7 | 17.6 | 17.2 |
| තේ | 4.4 | 1.6 | 1.7 | 0.5 | 2.0 | 1.9 |
| රබර් | 1.0 | 0.9 | 0.1 | 0.1 | 0.4 | 0.4 |
| පොල් | 20.6 | 5.1 | 7.4 | 1.9 | 2.2 | 2.1 |
| වී | 4.7 | 4.7 | 3.9 | 3.4 | 4.3 | 4.3 |
| අනෙකුත් | -0.1 | 2.6 | -0.2 | 3.8 | 8.7 | 8.5 |
| දැව ආදී වන ද්‍රව්‍ය | -0.2 | 1.2 | -0.1 | 0.3 | 1.4 | 1.3 |
| ධීවර | 1.4 | 4.9 | 0.5 | 1.5 | 1.8 | 1.8 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 6.0 | 3.4 | 2.8 | 1.4 | 2.5 | 2.4 |
| 3. නිමැවුම් කර්මාන්ත | 9.1 | 9.2 | 33.4 | 31.0 | 20.1 | 20.7 |
| තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | 13.0 | 4.4 | 5.2 | 1.7 | 2.3 | 2.2 |
| නිෂ්පාදන කර්මාන්ත | 8.8 | 10.0 | 26.5 | 27.6 | 16.4 | 17.0 |
| කුඩා කර්මාන්ත | 5.7 | 6.5 | 0.9 | 0.9 | 0.8 | 0.8 |
| අනෙකුත් | 6.8 | 7.8 | 0.8 | 0.8 | 0.6 | 0.6 |
| 4. ඉදිකිරීම් | 6.0 | 4.9 | 8.0 | 5.8 | 7.0 | 7.0 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 9.9 | 10.2 | 2.7 | 2.6 | 1.5 | 1.6 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සංනිවේදනය | 3.1 | 5.5 | 6.8 | 10.6 | 11.4 | 11.3 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 6.4 | 3.6 | 26.6 | 13.3 | 22.1 | 21.6 |
| ආනයන | 9.4 | 2.1 | 16.1 | 3.3 | 9.4 | 9.0 |
| අපනයන | 12.8 | 12.6 | 6.8 | 6.4 | 3.0 | 3.2 |
| දේශීය | 1.9 | 2.2 | 3.6 | 3.6 | 9.7 | 9.4 |
| 8. බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල | 9.5 | 10.5 | 9.7 | 9.9 | 5.6 | 5.9 |
| 9. නිවාස අයිතිය | 1.2 | 1.3 | 0.6 | 0.5 | 2.5 | 2.4 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 3.1 | 5.4 | 2.6 | 4.0 | 4.4 | 4.4 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 2.5 | 4.5 | 1.9 | 2.9 | 3.8 | 3.8 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 5.6 | 5.5 | 108.4 | 93.5 | 101.7 | 101.3 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | - | - | -8.4 | 6.5 | -1.7 | -1.3 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 5.3 | 5.9 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

* තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රථම වරට කෘෂිකාර්මික අංශය අභිබවා පෙරට ආ අතර, එය ඉතා සුළු වශයෙන් දෙවැනි වන්නේ තොග හා සිල්ලර වෙළඳ අංශයට පමණි. 1995 වර්ෂයේදී නිමැවුම් කර්මාන්ත අංශයෙහි වර්ධනය, පෙර වසරේ පරිදිම සියයට 9 ක් විය. 1995 වර්ෂයේ ආර්ථික වර්ධනයට මෙම අංශය සියයට 31 ක් වූ ඉහළම දායකත්වය සැපයූ අතර, එය ඊළඟට වැඩිම දායකත්වය සපයන අංශය හා සසඳන විට දෙගුණයකට වඩා වැඩි බව පෙනේ. කර්මාන්ත නිෂ්පාදන උප අංශයෙන් පමණක් 1995 වර්ෂයේ ආර්ථික වර්ධනයට වූ දායකත්වය සියයට 28 ක් විය. කර්මාන්ත නිෂ්පාදන අංශයෙහි මෙම සාර්ථක ක්‍රියාකාරිත්වය වඩාත් දක්නට ලැබුණේ අපනයනය සඳහා වූ කර්මාන්ත වල නිෂ්පාදනයන් තුළිනි. කාර්මික අපනයනවල වටිනාකම පෙර වසරේ පරිදිම, 1995 වසරේ මුළු අපනයන ආදායමෙන් සියයට 75 ක් විය. 1994 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20 ක් වූ නිමැවුම් කර්මාන්ත අංශයෙහි දායකත්වය, 1995 වර්ෂයේදී සියයට 21 දක්වා වැඩිවිය. කර්මාන්ත නිෂ්පාදන අතරින් ආහාරපාන හා දුම්කොළ, රෙදිපිළි, ඇඟලුම් හා සම් නිෂ්පාදන හා ලෝහ නොවන නිෂ්පාදන යන අංශයන් වර්ෂය තුළදී ඉතා සාර්ථක වර්ධනයන් වාර්තා කළේය. වැඩිම වර්ධන වේගය වාර්තා කළ උප අංශ වූයේ සියයට 13 කින් වර්ධනය වුණු රෙදිපිළි, ඇඟලුම් හා සම් නිෂ්පාදන උප අංශය හා සියයට 11 කින් වර්ධනය වුණු ආහාරපාන හා දුම්කොළ උප අංශයයි.

නිමැවුම් කර්මාන්ත අංශයෙහි ප්‍රමුඛ වර්ධනය ආර්ථිකයෙහි යහපත් ලක්ෂණයක් පෙන්නුම් කළ ද, රෙදිපිළි හා ඇඟලුම් මත දැඩි ලෙස රැඳී සිටීම සැලකිල්ලට භාජනය විය යුතු කරුණක් වේ. ඊට හේතුව විශාල වෙළෙඳපොලවලට ඇඟලුම් සැපයීම සම්බන්ධයෙන් වූ අපනයන පංගු බෙදා දෙන කාර්යය හා සම්බන්ධ වූ ජාත්‍යන්තර බහු කෙදි ගිවිසුම ක්‍රම ක්‍රමයෙන් අත්හිටුවන බැවිනි. මේ තත්ත්වය යටතේ නිශ්චිත සලාක නැති වෙළඳපොලවල් කරා ළඟාවීමට හැකිවන පරිද්දෙන් ඇඟලුම් කර්මාන්තය සිය ඵලදායිතාවය වැඩිකර ගත යුතු අතර, අපනයන හැකියාවන් ඇති නව කර්මාන්ත කෙරෙහි යොමු විය යුතු වේ.

සේවා අංශයෙහි (සංඛ්‍යා සටහන 2.1 හි අයිතම 5 සිට 11 දක්වා මේ අංශයට ඇතුළත්ය.) තියුණු වර්ධනය, වේගයෙන් දියුණු වන ආර්ථිකයන්හි සුලබව දැකිය හැකි ලක්ෂණයකි. මෙම අංශය 1995 වර්ෂයේදී සියයට 5 කින් වර්ධනය වූ අතර, මුළු වර්ධනයෙන් සියයට 44 කට දායක විය. මෙම අංශයෙහි ඉහළ වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ තොග හා සිල්ලර වෙළඳම, ගමනාගමනය, ගබඩා

පහසුකම් හා සන්නිවේදනය හා බැංකු, රක්ෂණ හා නිශ්චල දේපළ යන අංශයන්හි ක්‍රියාකාරිත්වයයි. දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 22 කට දායක වෙමින් තොග හා සිල්ලර වෙළඳුම ප්‍රධාන අංශය ලෙස අඛණ්ඩව පැවතින. ආනයන වෙළෙඳාමෙහි අඩු වර්ධනයක් පැවති නමුත්, අපනයන හා දේශීය වෙළෙඳාමෙහි දියුණුවක් දැකිය හැකිවිය. ආර්ථිකයෙහි සීඝ්‍රයෙන් වර්ධනය වන අංශයන් හා සෘජු සම්බන්ධතාවයක් ඇති මූල්‍ය අංශය මෙම වර්ෂයේදී සියයට 11 කින් වර්ධනය වූ අතර,පසුගිය වර්ෂයේ එම වර්ධනය සියයට 10 ක් විය. බැංකු, රක්ෂණ හා මූල්‍ය සේවාවන්ගේ අඛණ්ඩ ප්‍රසාරණය පෙන්නුම් කරමින් මෙම අංශය පසුගිය වර්ෂයේදී මෙන් 1995 වර්ෂයේදීද ආර්ථික වර්ධනයට සියයට 10 කින් දායක විය. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන යන අංශවල නිමැවුම වැඩිවීම හේතුවෙන් නිෂ්පාදිතය 1995 වර්ෂයේදී සියයට 14.8 කින් වර්ධනය වූ ලෙසට ඇස්තමේන්තු කර ඇත. ආර්ථිකයෙහි සමස්ත මිල වෙනස්වීම දක්වන ගම්‍ය මිළ දර්ශකය, 1995 වර්ෂයේදී සියයට 8.4 ක අඩු වේගයකින් ඉහළ ගිය අතර, පසුගිය වසරේ එහි වර්ධනය සියයට 9.4 ක් විය. ගම්‍ය මිල දර්ශකයෙන් පිළිබිඹු වන මෙම උපනතිය, කොළඹ පාරිභෝගික මිල දර්ශකය, මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ තොග අලෙවි මිල දර්ශකය වැනි අනෙකුත් මිල දර්ශක වලින් ද දැකිය හැකිවිය.

වෙළෙඳ මිල යටතේ දළ දේශීය වියදම රුපියල් දශ ලක්ෂ 725,710 ක් වූ අතර, පසුගිය වසර හා සසඳන විට එහි වැඩිවීම සියයට 12 ක් විය. පරිභෝජන වියදම සියයට 14 කින් ඉහළ ගිය අතර, ආයෝජන වියදම සියයට 6 කින් ඉහළ ගියේය. 1994 වර්ෂයේදී සියයට 16 කින් වර්ධනය වූ පෞද්ගලික පරිභෝජන වියදම 1995 වර්ෂයේදී සියයට 13 ක අඩු මට්ටමක වර්ධනයක් වාර්තා කළ අතර, මිල ගණන් ඉහළ යාම අඩුවීම මීට බලපෑ ප්‍රධාන හේතුව විය. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව සඳහා වූ රජයේ පරිභෝජන වියදම, ඉතා තියුණු අන්දමින් සියයට 24 කින් ඉහළ ගියේය.

රුපියල් දශ ලක්ෂ 166,370 ක් වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, සියයට 6 කින් වර්ධනය වුණු අතර, එයින් ඉතා වැඩි කොටසක් (සියයට 87 ක්) සම්පාදනය වූයේ පෞද්ගලික අංශයෙනි. 1994 මැතිවරණ වර්ෂයේ අඩුවීමක් පෙන්වූ රාජ්‍ය අංශයේ ආයෝජනය, මෙම වර්ෂයේදී සියයට 18 කින් වර්ධනය

**විශේෂ සටහන 1**

## ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය

රටක ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.), රටවල් අතර ආදායම් මට්ටම් සංසන්දනය කිරීම සඳහා යොදා ගතහැකි යෝග්‍ය මිණුම් දණ්ඩයක් නොවේ. මන්ද, එය ඒක පුද්ගල ආදායම මගින් විවිධ රටවල් වලදී මිලට ගතහැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය කොතෙක්ද යන්න පෙන්නුම් නොකරන බැවිනි. විවිධ ව්‍යවහාර මුදල් වර්ගවල ක්‍රය ශක්තිය සඳහා ගැලපීම් කිරීමට සහ එමගින් රටවල් අතර ආදායම් සංසන්දනය කිරීම පහසු කරවනු පිණිස ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ක්‍රය ශක්ති සාම්‍ය (මිලට ගැනීමේ හැකියාව මත පදනම් වූ ) ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය බවට පරිවර්තනය කර ඇත. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය, ක්‍රය ශක්ති සාම්‍ය ඒ.පු.ද.ජා.නි. බවට පෙරළීම සඳහා පරිවර්තන සාධකයක් අවශ්‍යය. මෙහිදී පරිවර්තන සාධකය වශයෙන් අර්ථ දක්වනු ලබන්නේ, එක්සත් ජනපදයේදී එක්සත් ජනපද ඩොලරයකට මිලට ගතහැකි භාණ්ඩ හා සේවා පැසට හෝ ඊට සමාන භාණ්ඩ හා සේවා පැසක් මිලට ගැනීම සඳහා කිසියම් රටක භාවිතා වන දේශීය ව්‍යවහාර මුදලින් කොපමණ ඒකක ප්‍රමාණයක් අවශ්‍ය වේද යන්නයි. ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ගණන් බැලීම සඳහා මිනුම් ඒකකය වශයෙන් එක්සත් ජනපද ඩොලරය යොද ගන්නද, ඒ සඳහා, වෙනත් ඕනෑම ව්‍යවහාර මුදලක් වුවද භාවිතා කළ හැකිය.

ලෝක බැංකු ප්‍රකාශනයක් වන "ලෝක සංවර්ධන වාර්තාව 1995" හි ඇති මෑතකාලීනම දත්ත (1993 වර්ෂය සඳහා) වලට අනුව, කාර්මික රටවල්වල ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල ද.ජා.නි. අගයන් අනුරූප ඒක පුද්ගල ද.ජා.නි. ට වඩා තරමක අඩු අගයයන් ගෙන ඇති අතර, නැගෙනහිර ආසියාවේ හොංකොං, තායිවානය සහ දකුණු කොරියාව වැනි මෑතකදී කාර්මීකරණය වූ රටවල්වල ක්‍රය ශක්ති සාම්‍ය ඒ.පු.ද.ජා.නි. අගයයන්, අනුරූප ඒකපුද්ගල ද.ජා.නි. යන් අතර සුළු වෙනසක් පෙන්වමින් ඉහළ අගයන් ගෙන ඇත. නැගෙනහිර ආසියාවේ, මැලේසියාව, තායිලන්තය සහ ඉන්දුනීසියාව වැනි සීඝ්‍රයෙන් වර්ධනය වන රටවල් සම්බන්ධයෙන් මෙන්ම ඉන්දියාව, පකිස්තානය, බංගලාදේශය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන දකුණු ආසියාතික රටවල ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල ද.ජා.නි. අගයන් අනුරූප ඒකපුද්ගල ද.ජා.නි. අගයයන් මෙන් ඇතැම් විට හය ගුණයක් පමණ දක්වා ඉහළ අගයන් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල ද.ජා.නි., අනුරූප ඒකපුද්ගල ද.ජා.නි. මෙන් පස් ගුණයක් තරම් විය. රටවල් අතර වන ආදායම් විෂමතාවයන්, ක්‍රය ශක්ති සාම්‍යය ඒක පුද්ගල ද.ජා.නි. යටතේ පරීක්ෂා කිරීමේදී, නිරපේක්ෂ ද.ජා.නි. යටතේ දක්වනවාට වඩා අඩු බවක් පෙන්නුම් කරනු ලබන බව පැහැදිලිය. නිදර්ශනයක් වශයෙන්, ඇමෙරිකා එක්සත් ජනපදයේ (ඇ.එ.ජ.) ඒක පුද්ගල ද.ජා.නි., ඩොලර් වටිනාකම අනුව, ලංකාවේ ඒක පුද්ගල ද.ජා.නි. වඩා 40 ගුණයක් පමණ වන අතර, ඇ.එ.ජ. ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල ද.ජා.නි. අගය ලංකාවේ එම අගයට වඩා වැඩි වන්නේ අට ගුණයකින් පමණි.

භාණ්ඩ ප්‍රවාහනය ඉහළ යාමත් මගී ප්‍රවාහන 'රථ සංඛ්‍යාවෙහි සැලකිය යුතු වර්ධනයත් හේතුකොට ගෙන ගමනාගමන හා සංනිවේදන අංශය සියයට 5.5 කින් වර්ධනය විය. මීට අමතරව, වර්ෂය තුලදී සංනිවේදන කාර්යයන්හි සහ වරාය වැඩකටයුතු වල තියුණු ප්‍රසාරණයක් දැකිය හැකිවිය. සංනිවේදන සේවාවන් 1995 වර්ෂයේදී සියයට 14 කින් වර්ධනය වූ අතර, එම අංශය වඩාත් කාර්යක්ෂමව වැඩෙන අංශයක් බවට පත්විය. අපනයන පරිමාවේ සහ කොළඹ වරාය හරහා ගමන් කරන නෞකා කටයුතුවල වැඩිවීම පෙන්නුම් කරමින්, වරාය කටයුතු සියයට 7 කින් වර්ධනය විය.

පවත්නා සාධක වියදම් මිල අනුව දළ ජාතික

වෙමින් සතුටුදායක තත්ත්වයට පත්වූ අතර, පෞද්ගලික අංශයේ ආයෝජනයෙහි (1994 සහ 1995 වර්ෂයන්හි ගුවන් බස්යානා මිලදී ගැනීම් අනහැර සලකන කළ) සියයට 9.6 ක වර්ධන උපනතියක් වාර්තා කළ නමුත්, විදේශ ආයෝජනයන් හා ඉදිකිරීම් කටයුතු අඩුවීම හේතුකොට ගෙන එම වර්ධනය පසුගිය වර්ෂයට වඩා අඩු මට්ටමක පැවතුණි. උද්ධමනය සඳහා ගැලපූ කළ, සමස්ත දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මූර්ත වශයෙන් සියයට 1 කින් අඩු වූ අතර, පසුගිය වසරේ එය සියයට 9 කින් වර්ධනය වුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ විදේශ ආයෝජන තියුණු ලෙසින් අඩුවීමයි.

ආර්ථිකයෙහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය හා ඉතිරි කරන්නන්හට ලැබෙන ආකර්ශනීය සාතුබලයන් පිළිබිඹු කරමින්. 1995 වර්ෂයේදී දේශීය ඉතිරි කිරීම් රුපියල් දශ ලක්ෂ 102,562 දක්වා එනම් සියයට 16 කින් ඉහළ ගිය බව ඇස්තමේන්තු කර ඇත. 1995 වර්ෂයේදී දේශීය ඉතිරි කිරීම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 15.5 ක් වූයෙන්, 1994 වර්ෂයේ වූ සියයට 15.2 හා සමඟ සසඳන විට එය වැඩිදියුණු වීමකි. මේ අතර විදේශීය ඉතිරි කිරීම් ද ඇතුළත් වන ජාතික ඉතිරි කිරීමේ අනුපාතය සියයට 19.1 සිට සියයට 19.7 දක්වා සතුටුදායක වර්ධනයක් පෙන්වා ඇත.

## 2.2 ආංශික ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික අංශයෙහි එකතු කළ වටිනාකම 1995 වර්ෂයේදී සියයට 3.3 කින් ඉහළ ගියේය. කෙසේවුවද, මෙම අංශයෙහි මන්දගාමී වර්ධනය, දළ දේශීය නිෂ්පාදිතයට එම අංශයෙහි සාපේක්ෂ වැදගත්කම අඩු කරන්නට හේතුවී ඇත. 1960 දශකයෙහි මුල් වසරවලදී කෘෂි අංශය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 40 කට පමණ දායක විය. මෙය, 1990 වර්ෂය වනවිට සියයට 23 දක්වා අඩු වූ අතර, 1995 වර්ෂයේදී සියයට 20 දක්වා තවදුරටත් අඩුවෙමින්, කාර්මික අංශයටත් වඩා අඩු මට්ටමකට පත්විය. මෙය, එක් අතකින් ශ්‍රී ලංකා ආර්ථිකය වඩාත් විවිධාංගීකරණ ව්‍යුහයකට ක්‍රමිකව යොමුවීමේ ප්‍රතිඵලයක් විය.

තේ, රබර් හා පොල් වගාවන්ගේ එකතු කල අගය 1995 වර්ෂයේදී පිළිවෙලින් සියයට 1.6 කින්, 0.9 කින් හා 5.1 කින් ඉහල ගියේය. රබර් මිල වර්ෂය තුලදී දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගිය නමුත් නිෂ්පාදනය වැඩි වූයේ ඉතා සුළු වශයෙන්, සියයට 0.4 ක ප්‍රමාණයකින් පමණි. මේ අතර රබර් අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා කර්මාන්තයන්හි වූ වර්ධනය නිසා දේශීය ස්වාභාවික රබර් පරිභෝජනය මෑත වර්ෂ වලදී ඉහළ ගොස් ඇත. තේ මිලෙහි වැඩිවීමක් ද වර්ෂයේ අග භාගයේදී දක්නට ලැබුණි. හිතකර කාලගුණික තත්ත්වයන්ගේ සහ පොහොර භාවිතය වැඩිවීමේ පසු කාලීන බලපෑම පිළිබිඹු කරමින් පසුගිය වර්ෂයේදී සියයට 20.6 කින් වර්ධනය වූ පොල් නිෂ්පාදනය, 1995 දී තවදුරටත් සියයට 5.1 කින් වර්ධනය විය. සමස්ත වශයෙන්, මෙම වැවිලි බෝග තුන, මුළු අපනයන ආදායමින් සියයට 18 කට හා කෘෂි අපනයනයන්ගෙන් සියයට 84 කට දායක වේ. කෙසේ වුවද. භෝග විවිධාංගීකරණය නිසාත් සම්පත් සීමිතවීම හා දුර්වල කළමනාකරණය හේතුකොට ගෙන ආයෝජනය හිඟවීම නිසාත්, කෘෂිකාර්මික අංශය තුළ මෙම වැවිලි භෝග තුනෙහි වැදගත්කම ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

වඩාත්ම වැදගත් භෝගය වූ වී, සියයට 4.7 ක වර්ධනයක් දක්වමින් මෙට්‍රික් ටොන් 2,810,000 ක වාර්තාගත නිෂ්පාදන මට්ටමක් වාර්තා කළේය. නිෂ්පාදනයේ වූ මෙම වර්ධනය නිසාත්, දැඩි සහතාධාර මිලකට තිරිඟු පිටි ලබාදීමේ හේතුවෙන් සහල්වලට ඇති ඉල්ලුම අඩුවීම නිසාත්, 1995 වසරේ සහල් ආනයනය ඉතා අවම මට්ටමක් දක්වා පහත වැටුණි.

අනෙකුත් සියළුම භෝග වර්ග සහ සත්ව පාලනය ඇතුලත් වන "අනෙකුත් කෘෂිකාර්මික" කටයුතු 1995 දි සියයට 2.6 කින් වර්ධනය විය. බොහෝ අතුරු ආහාර භෝගවල නිෂ්පාදනය වර්ෂය තුලදී සැලකිය යුතු අන්දමින් ඉහළ ගියේය. සත්ව පාලනයේද සැලකියයුතු වර්ධනයක් දකින්නට තිබුණි. මෑත කාලයේදී නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් වඩාත් සංවිධිත තත්ත්වයකට පත්වූ කුකුළු පාලනය, වර්ෂය තුලදී ඉතා හොඳ ප්‍රගතියක් පෙන්වීය. සංවිධිත පෞද්ගලික ආයතන විසින් අඛණ්ඩව මිලදී ගැනීම කිරි නිෂ්පාදනය දිරි ගැන්වීම හේතුවෙන්, 1995 වර්ෂයේදී කිරි නිෂ්පාදනය සියයට 11 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, සුළු අපනයන භෝග විසින් වර්ධනයට සෘන දායකත්වයක් කරන ලදී. මීට හේතුව වූයේ මෙම කාණ්ඩයට ගැණෙන සමහර ප්‍රධාන භෝගයන්හි නිෂ්පාදනය අඩු විමය.

ධීවර අංශය 1995 වර්ෂයේදී පෙන්වූයේ හිතකර ක්‍රියාකාරිත්වයකි. අළුත් ධීවර බෝට්ටු යාත්‍රා හා ධීවර ආම්පන්න කර්මාන්තයට එක්වීම, එක්දින යාත්‍රා සංඛ්‍යාව බහු දින යාත්‍රා බවට පරිවර්තනය කිරිම ඉහළ යාම, ඈත මුහුදේ මසුන් මැරීම ඉහළ යාම යනාදී කරුණු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වේගයකින් ඉහළ යාමට දායක විය. ඒ අතරම අපනයනය සඳහා ඉස්සන් ඇති කිරිමත් ඉතා වාසිදායක ව්‍යාපාරයක් බවට පත්විය.

පතල් හා කැණීම් අංශයට වැඩි දායකත්වයක් සපයන මැණික් නිෂ්පාදනය, 1995 දී පෙන්වූයේ සෘණ වර්ධනයකි. වටිනා සහ අර්ධ වටිනා ගල් අපනයනයන්ගෙන් වූ ඉපයීම් (විගැහි අනුව වටිනාකම ගණනය කළ) වසර තුලදී සියයට 7 කින් අඩු විය. කෙසේ වුවද, මිනිරන් ඇතුළු අනෙකුත් පතල් අංශයේ ක්‍රියාකාරිත්වය සතුටුදායක විය. විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳපල අරමුණු කරගත් පිඟන් භාණ්ඩ හා පිඟන් ගඩොල් කර්මාන්තයේ වූ ප්‍රසාරණය, අමුද්‍රව්‍ය සඳහා කැණීම් කටයුතු වල වර්ධනයට හේතු විය. සමස්ථයක් වශයෙන් පතල් හා කැණීම් අංශය 1995 වර්ෂයේදී වාර්තා කළ මූර්ත වර්ධනය සියයට 3.4 ක් විය.

කර්මාන්ත නිෂ්පාදන, තේ, රබර් හා පොල් නිෂ්පාදන සැකසීම හා කුඩා කර්මාන්ත යන උප අංශයන්ගෙන් සමන්විත නිමැවුම් කර්මාන්ත අංශය දශකයකටත් වැඩි කාලයක් තුළ වැඩිම වර්ධනයක් ලබාදුන් අංශය බවට පත්ව ඇත. 1982 දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14 ක් වූ එහි දායකත්වය 1995 වන විට සියයට 20 දක්වා අඛණ්ඩව වැඩිවී ඇත. මෙම අංශයේ එකතු කළ අගයෙන් සියයට 82 කටම කර්මාන්ත නිෂ්පාදන අංශය දායක වූ අතර, ඉන් පිළිබිඹු වන්නේ වතු වැවිලි අංශයේ අඩු වර්ධනය හා කුඩා කර්මාන්ත අංශය සැලකිය යුතු ලෙස ඌණ තක්සේරු කිරිමකට ලක්වී ඇති බවයි.

කර්මාන්ත නිෂ්පාදන උප අංශයේ ප්‍රසාරණයට ආධාර වූයේ 1989 සිට ක්‍රියාත්මක වූ ලිහිල්කරණ ප්‍රතිපත්ති තුලින් ලැබුණු දිරිදීම් හා විටින් විට ප්‍රදානය කරන ලද ආකර්ශණීය බදු සහනයි. මෙම උප අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් දායකත්වය ලබාදුන්නේ කර්මාන්ත නිෂ්පාදනයන්ගෙන් සියයට 85 කට වැඩි ප්‍රතිශතයකට හිමිකම් කියන රෙදිපිළි, ඇඟලුම් හා සම් නිෂ්පාදන සහ ආහාර පාන සහ දුම්කොළ යන උප අංශයන්ගේ විශාල වර්ධනයයි. කර්මාන්ත නිෂ්පාදන උප අංශය,

1982 දී නිමැවුම් කර්මාන්ත අංශයේ එකතු කළ අගයෙන් සියයට 65 කට හිමිකම් කී අතර, 1995 වන විට එම ප්‍රතිශතය සියයට 82 දක්වා වැඩි විය.

නිමැවුම් කර්මාන්තයෙහි අනෙකුත් වැදගත් උප අංශය වන්නේ තේ, රබර් හා පොල් නිෂ්පාදන සැකසීමයි. මෙම උප අංශය, ඉහත දැක්වූ කෘෂිකාර්මික අංශයේ උපනතින් පිළිබිඹු කරමින්, 1995 දී සියයට 4.4 ක වර්ධන වේගයක් වාර්තා කළේය. පසුගිය වසරේ සියයට 5.7 කින් වර්ධනය වූ, ප්‍රධාන වශයෙන් ගෘහස්ථ මට්ටමේ කර්මාන්ත නියෝජනය වන කුඩා කර්මාන්ත උප අංශය, 1995 දී සියයට 6.5 කින් වර්ධනය විය. ස්වයං රැකියා අවස්ථාවන් උත්පාදනය කළ සහ ප්‍රසාරණය කළ, මෙම අංශයේ විශාල වර්ධනයක් ඇති වූ බවට සාධක ඇති නමුත්, ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන ලබාගැනීමේ අපහසුතාව නිසා එය ඇස්තමේන්තු කිරීම අසීරු කාර්යයක් වේ. ප්‍රධාන වශයෙන් බේකරි කර්මාන්තය හා වී කෙටීම ඇතුලත් වන අනෙකුත් කර්මාන්ත උප අංශය, වී නිෂ්පාදනයේ ඉහල යාමත්, බේකරි නිෂ්පාදන සඳහා වැඩිවන ඉල්ලුමත් පෙන්නුම් කරමින් සියයට 7.8 කින් ප්‍රසාරණය විය.

ගොඩනැගිලි ඉදිකිරීම සහ පොදු කාර්ය පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් ඇතුලත් වන ඉදිකිරීම් අංශය, 1995 දී සියයට 5 කින් වර්ධනය වුනු අතර, සමස්ථ ආර්ථික වර්ධනයට එයින් වූ දායකත්වය සියයට 6 ක් විය. පසුගිය වසරේ මෙම අංශයේ වර්ධනය සියයට 6 ක් වූ අතර, සමස්ත ආර්ථික වර්ධනයට වූ දායකත්වය සියයට 8 ක් විය. විදේශ ප්‍රාග්ධන ගලාඒම අඩුවීම, කර්මාන්ත හා සේවා අංශයන්හි ඉදිකිරීම් කටයුතු අඩුකිරීමට හේතු වූ බව පෙනී යයි. එසේම තාවකාලික වශයෙන් ඇති වූ සිමෙන්ති හිඟය හා මිල ඉහළ යාමත්, නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී ඇති වූ ඇතැම් ප්‍රමාදයනුත් නිවාස ඉදිකිරීම්කටයුතුවල වර්ධනය අඩුවීමට හේතු විය. එසේ වුවත් මාර්ග තැනීම සම්බන්ධයෙන් රජයෙන් වෙන්කළ වැඩි ප්‍රතිපාදන උපයෝජනයට ගැනීම වැඩිවීමේ හේතුවෙන් එම අංශයේ ප්‍රසාරණයක් දැකිය හැකි විය.

විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා අංශය සියයට 10.2 කින් වර්ධනය විය. ගෑස් සඳහා පරිභෝගිකයන්ගේ වැඩෙන රුචිකත්වය පිළිබිඹු කරමින්, මෙම අංශයේ වැඩිම වර්ධනය වාර්තා කළේ ගෑස් උප අංශයයි. විදුලි බල උත්පාදනය, 1995 දී සියයට 10 කින් ඉහළ ගිය අතර, විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘතීන් යටතේ වූ ජලනල පහසුකම් සැපයීමද වර්ෂය තුලදී ඉහළ ගියේය.

1994 දී සියයට 3 කින් වර්ධනය වූ ප්‍රවාහන, ගබඩා පහසුකම් හා සංනිවේදන අංශය, 1995 දී සියයට 6 කින් ඉහළ ගිය අතර, දළ ජාතික නිෂ්පාදනයේ වර්ධනයට එමගින් වූ දායකත්වය සියයට 11 ක් විය. මෙම අංශයේ වාර්තා වූ සියයට 14 ක වැඩිම වර්ධනය සංනිවේදන උප අංශය වාර්තා කල අතර, ඊට එක් හේතුවක් වූයේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආයෝජන ඉහළ යාමයි. පෞද්ගලික අංශයේ සහභාගිත්වය වැඩිවීම මෙම වර්ධන ක්‍රියාවලියට ආධාර විය. 1995 දී සෙලියුලර් දුරකථන, පේජර් ඒකක (Paging Unit) හා දුරකථන කුටි සංඛ්‍යාව සියයට 75 කටත් වඩා ඉහළ ගියේය. තැපැල් සේවයේ හා වරාය හා නාවික ක්‍රියාකාරම්හි ද එකතු කළ අගය වර්ෂය තුලදී ප්‍රසාරණය විය. කොළඹ වරායේ පහසුකම් නවීකරණය කිරීම නිසා, කන්ටේනරගත භාණ්ඩ ප්‍රවාහනයෙහි සැළකිය යුතු ඉහළ යාමක් දක්නට ලැබුණි. ඒ අතරම ඉහළ ගිය ඉල්ලුමට සමාන්තරව ගබඩා පහසුකම් හා කන්ටේනර නවතා තැබීමේ පහසුකම් ද ප්‍රසාරණය විය.

භාණ්ඩ ප්‍රවාහණය, පොදු බස් හා දුම්රිය සේවා හා ගුවන් සේවාවන් ඇතුළත් වන ප්‍රවාහන උප අංශය 1995 දී සියයට 4.2 කින් වර්ධනය විය. අපනයන හා දේශීය වෙළඳාමේ වර්ධනය, භාණ්ඩ ප්‍රවාහනයේ එකතු කළ අගය ඉහළ යෑමට හේතු විය. නව බස් රථ විශාල සංඛ්‍යාවක් වර්ෂය තුළදී එකතු කෙරුණු අතර, දුම්රිය ප්‍රවාහනයෙහි එකතු කළ අගය ඉතා සුළු ඉහළ යාමක් පෙන්විය. ජාතික ගුවන් සේවයට නව යානා එකතු කිරීම මගින් ඇතිවූ ධාරිතාවය ඉහළ යාම නිසා ගුවන් ගමනාගමනයෙහි වර්ධනයක් ද දැකිය හැකි විය.

තොග හා සිල්ලර වෙළෙඳම් අංශය සියයට 4 කින් වර්ධනය වූ අතර, පසුගිය වසරේ එම අංශයෙහි ඉහළ යාම සියයට 6 ක් විය. 1994 වර්ෂයේදී දළ ජාතික නිෂ්පාදිතයෙහි සමස්ත වර්ධනයට මෙම අංශයෙන් වූ සියයට 27 ක දායකත්වය, ආනයන වෙළඳ කටයුතුවල පහත වැටීමේ හේතුවෙන්, 1995 වර්ෂයේදී සියයට 13 දක්වා අඩුවූ නමුත්, දළ ජාතික නිෂ්පාදිතයට වැඩිම දායකත්වය ලබාදෙන අංශය ලෙස රැඳී සිටීමට තවදුරටත් සමත් විය. අපනයන වෙළෙඳාමේ එකතු කළ අගය සියයට

**සංඛ්‍යා සටහන 2.2**

**සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1982 - 1995**

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිල අනුව රු. දශ ලක්ෂ | | | | 1982 මිල අනුව රු. දශ ලක්ෂ | | | | 1982 මිල අනුව ප්‍රතිශතය | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1993* | 1994* | 1995* | 1982 | 1993* | 1994* | 1995* | 1982 | 1993 | 1994 | 1995 | 1994 | 1995 |
| 1. මුළු සම්පත් | 145,143 | 716,304 | 843,313 | 963,445 | 145,143 | 235,016 | 254,783 | 264,674 | 100 | 100 | 100 | 100 | 8.4 | 3.9 |
| වෙළෙඳමිළ අනුව ද.දේ.නි. | 99,238 | 499,760 | 579,147 | 661,902 | 99,238 | 158.,208 | 167,068 | 176,257 | 68 | 67 | 66 | 67 | 5.6 | 5.5 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 45,905 | 216,544 | 264,166 | 301,543 | 45,905 | 76,808 | 87,715 | 88,417 | 32 | 33 | 34 | 33 | 14.2 | 0.8 |
| 2. උපයෝගිකරණය | 145,143 | 716,304 | 843,313 | 963,445 | 145,143 | 235,016 | 254,783 | 264,674 | 100 | 100 | 100 | 100 | 8.4 | 3.9 |
| පරිභෝජනය | 87,468 | 419,576 | 490.948 | 559,340 | 87,468 | 139,729 | 148,657 | 155,307 | 60 | 59 | 58 | 59 | 6.4 | 4.5 |
| ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 30,279 | 126,070 | 154,310 | 165,420 | 30,279 | 39,946 | 43,571 | 43,068 | 21 | 17 | 17 | 16 | 9.1 | -1.2 |
| රජය | 4,866 | 20,765 | 17,661 | 20,877 | 4,866 | 5,531 | 4,335 | 4,617 | 3 | 2 | 2 | 2 | -21.6 | 6.5 |
| පෞද්ගලික අංශය හා රජයේ සංස්ථා | 25,413 | 105,305 | 136,649 | 144,543 | 25,413 | 34,415 | 39,236 | 38,451 | 18 | 15 | 15 | 15 | 14.0 | -2.0 |
| තොග වෙනස්වීම් | 248 | 1,800 | 2,250 | 950 | 248 | 325 | 387 | 152 | .. | .. | .. | .. | 19.1 | -60.7 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 27,148 | 168,858 | 195,805 | 237,735 | 27,148 | 55,016 | 62,168 | 66,147 | 19 | 23 | 24 | 25 | 13.0 | 6.4 |

* තාවකාලික
** සියයට එකකට වඩා අඩු සංඛ්‍යා

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

12.6 කින් වැඩිවුණු අතර, දේශීය වෙළෙඳමේ එම ඉහළ යාම සියයට 2.2 ක් විය.

බැංකු, රක්ෂණ හා නිශ්චල දේපළ අංශයේ එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 11 කින් වර්ධනය වූ අතර, සමස්ත දළ ජාතික නිෂ්පාදනයෙහි වර්ධනයට එහි දායකත්වය සියයට 10 ක් විය. 1995 වර්ෂයේදී වාණිජ බැංකු විසින් සපයන ලද පහසුකම් හා සේවාවන් තවදුරටත් ව්‍යාප්ත විය. වාණිජ බැංකු මෙම අංශයෙන් සියයට 53 ක් පමණ නියෝජනය කරයි. දේශීය ණය දීම්වල වූ සැළකිය යුතු වර්ධනයත්, නව මූල්‍ය ගණුදෙනු උපකරණ හා නවීන පහසුකම් තුළින් ඇතිවූ විවිධාංගීකරණයත්, වාණිජ බැංකු අංශයෙහි වර්ධනයට හේතු විය. තවද, බැංකු කටයුතුවල වර්ධනය සඳහා මනා පරිසරයක් ඇතිකරමින්, වර්ෂය තුල නව වාණිජ බැංකු විවෘත කිරීම මගින් මෙම අංශය සඳහා තිබෙන විශ්වාසය පිළිබිඹු විය. කොටස් වෙළඳපොලෙහි ක්‍රියාකාරිත්වය අඩාල වීම, තැරැව්කාර සමාගම් වලින් කෙරෙන එකතු කළ අගය අඩු වීමට හේතුවිය. වඩාත් තරඟකාරී භාවයට පත්වූ රක්ෂණ උප අංශය, වර්ෂය තුලදී වඩාත් තියුණු ලෙසින් වර්ධනය විය. නව රක්ෂණ ක්‍රම හඳුන්වා දීමත්, විවිධ ප්‍රචාරණ කටයුතු මගින් ඒවා අලෙවිකිරීමත් මෙම කර්මාන්තයෙහි වර්ධනයට හේතුවිය. මෙම අංශයෙහි එකතු කළ අගය 1995 වර්ෂයේදී සියයට 4 කින් වර්ධනය විය.

## 2.3 වියදම

වෙළෙඳපොල මිළ අනුව රුපියල් දශ ලක්ෂ 725,710 ක් වූ දල දේශීය වියදම 1995 වර්ෂයේදී සියයට 12 ක වර්ධනයක් පෙන්විය. වර්ෂය තුළදී පරිභෝජන වියදම සියයට 13.9 කින් වර්ධනය වූ අතර. ආයෝජන වියදමේ වූ වර්ධනය සියයට 6.3 ක් විය. මුළු පරිභෝජන වියදමින් සියයට 85 කට වඩා වන, පෞද්ගලික පරිභෝජන වියදම සියයට 12.7 කින් වර්ධනය විය. මෙම වර්ධනය, මූල්‍ය ආදායමේ වර්ධනයට වඩා අඩු වර්ධනයක් වූ බැවින්, පෞද්ගලික පරිභෝජනය, දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එය සුළු වශයෙන් අඩු විය. එසේම, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් පෞද්ගලික පරිභෝජනය අඩු වන්නට තවත් හේතුවක් වූයේ කල් පවතින පරිභෝජන භාණ්ඩ සඳහා වූ ඉල්ලුම අඩුවීමයි. පෞද්ගලික පරිභෝජන වියදම් භාණ්ඩ පැසෙහි සියයට 28 ක් නියෝජනය කරන පාරිභෝගික භාණ්ඩ ආනයනය, 1994 වර්ෂයේදී සියයට 24 සිට, 1995 වර්ෂයේදී සියයට 13 දක්වා සැළකිය යුතු අන්දමින් අඩුවිය. වැටුප් වැඩි කිරීම්, සහනාධාර හා ඉහළ ගිය ආරක්ෂක වියදම් නිසා රාජ්‍ය පරිභෝජන වියදම් සියයට 24 කින් ඉහළ ගියේය.

**සංඛ්‍යා සටහන 2.3**

**ජාතික ඉතුරුම් (පවත්නා වෙළෙඳ මිළ අනුව)**

රු. දශලක්ෂ

| ශීර්ෂය | 1982 | 1993 * | 1994 * | 1995 * |
|---|---|---|---|---|
| 1 වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | 99,238 | 499,760 | 579,147 | 661,902 |
| 2 දේශීය ඉතුරුම් | 11,770 | 80,184 | 88,199 | 102,562 |
| 3 විදේශීය ශුද්ධ සාධක ආදායම | -1,959 | -5,979 | -8,310 | -7,082 |
| 4 විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 5,494 | 27,090 | 30,989 | 34,820 |
| 5 ජාතික ඉතුරුම් | 15,305 | 101,295 | 110,878 | 130,300 |
| 6 දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1 හි % ලෙස ) | 11.9 | 16.0 | 15.2 | 15.5 |
| 7 ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි % ) | 15.4 | 20.3 | 19.1 | 19.7 |

*තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම ආයෝජන වියදම් ඇතුලත්වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශ ලක්ෂ 166,370 දක්වා සියයට 6 කින් වැඩිවිය. 1994 වර්ෂයේදී සුළු වශයෙන් පහත වැටුණු රාජ්‍ය අංශයේ ආයෝජන, 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 20,927 ක් දක්වා සියයට 18 කින් ඉහළ ගියේය. 1994 වර්ෂයේදී සියයට 30 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ ආයෝජන වියදම, 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 145,443 දක්වා සියයට 5 කින් වර්ධනය විය. 1994 වර්ෂයෙහි වාර්තා වුණු ඉහල වර්ධනයට හේතුව වූයේ ජාතික ගුවන් සේවය වූ එයාර් ලංකා ආයතනය ගුවන් යානා මිළයට ගැනීමයි. ගුවන් යානා මිළයට ගැනීම නොසළකා හැරියහොත්, ආයෝජන වියදම් දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්කළ, සියයට 1.2 ක අඩුවීමක් පෙන් වූ අතර, එයට සෘජු විදේශ ආයෝජනයන්ගේ අඩු වීම ප්‍රධාන වශයෙන් දායක විය. දල දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ආයෝජනයෙහි අඩුවීමට තවත් හේතුවක් වූයේ ඉහත සඳහන් කළ පරිදි ඉදිකිරීම් කටයුතුවල සිදුවූ මන්දගාමී වර්ධනයයි.

## 2.4 සම්පත් හා සම්පත් උපයෝජනය

දළ දේශීය නිෂ්පාදනය සහ භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනවල (විදේශීය සම්පත්) මුළු එකතුව ලෙස නිර්වචනය කරනු ලබන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය, 1994 වර්ෂයේදී රුපියල් බිලියන 843 සිට 1995 වර්ෂයේදී රුපියල් බිලියන 963 දක්වා වැඩිවිය. සමස්ත සම්පත් ප්‍රමාණයේ වැඩිවීම වූ රුපියල් බිලියන 120 න් රුපියල් බිලියන 83 ක්, දළ දේශීය නිෂ්පාදනයෙහි වැඩිවීමෙන්ද, රුපියල් බිලියන 37 ක් විදේශ සම්පත් වැඩිවීමෙන් ද ලැබුණි. සමස්ත සම්පත් ප්‍රමාණයෙන් සියයට 58 ක් පරිභෝජනය සඳහා ද, සියයට 17 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද වෙන්වුණු අතර, ඉතිරි සියයට 25 අපනයන හා සාධක නොවන සේවා අංශයට යොමුවිය.

1982 වර්ෂයේ මිල ගණන් අනුව බලනවිට සම්පත් ප්‍රමාණය 1995 වර්ෂයේදී සියයට 3.9 කින් වර්ධනය වුණු අතර, එම වර්ධනය 1994 වර්ෂයේදී සියයට 8.4 ක් විය. මූර්ත වශයෙන්, 1994 වර්ෂයේදී සියයට 6.4 කින් වර්ධනය වූ පරිභෝජන වියදම 1995 වර්ෂයේදී සියයට 4.5 කින් ඉහළ ගිය අතර, 1994 වර්ෂයේදී සියයට 9.1 කින් වර්ධනය වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1995 වර්ෂයේදී සියයට 1.4 කින් අඩුවිය.

## 2.5 ජාතික ඉතිරිකිරීම්

දේශීය ඉතිරි කිරීම් 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 102,562 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.5 ක් වූ අතර, පසුගිය වර්ෂයට වඩා සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 1994 වර්ෂයේදී දේශීය ඉතිරි කිරීම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 15.2 ක් විය. ප්‍රධාන වශයෙන් විදේශ රටවල සිටින ශ්‍රී ලාංකික සේවකයන් විසින් එවනු ලබන මුදල්වලින් සමන්විත වන, ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම, 1995 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 34,820 ක් වූ අතර, එහි වර්ධනය සියයට 12.4 ක් විය. ශුද්ධ විදේශීය ආදායමද ඇතුළත් ජාතික ඉතිරිකිරීම්, 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 130,300 දක්වා වර්ධනය වුණු අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.7 ක් විය.